# (රාජපක්ෂ) ඇන්ඩ් කොම්පැනි

## සුනන්ද දේශප්‍රිය විසිනි

ඇන්ඩ් කොම්පැනි ස්වර්ණවාහිනියේ රඟ දැක්වෙන දේශපාලන කොමඩියකි. බන්දුල පත්මකුමාර විසින් ජනප්‍රිය කරන ලද පුවත්පත් කාටූන් විසින් දේශපාලනඥයින් උපහාසයට ලක් කරන තරමට ම වාගේ ඇන්ඩ් කොම්පැනි කොමඩිය ද අපව හිනස්සයි. ඒ සිනහව යටින් ඇත්තේ කණගාටුවක් සහ කේන්තියකි. කනගාටුව අප ගැන ය. කේන්තිය දේශපාලුවන් ගැන ය.

සෘජු දේශපාලන විවේචනය වෙනුවට උපහාසය රජ වන්නේ මර්ධනකාරී කාල පරිච්ජේදයන්හි දී බව කියනු ලැබේ. රජතුමා හෙළුවෙන් යැයි මන'කල්පිත කොලු ගැටයා ලවා කියවනුයේ ඒ නිසා ය. ස්ටාලින් යුගයෙහි සෝවියට් දේශයේ විහිළු කතා තොග ගණනේ බිහි වූයේ ඒ නිසා ය.

## කෙටි පණිවිඩයක්

ඊයේ පෙරේදා අපේ ජංගම දුරකථනයන්ට ලැබුනු එස්එම්එස් කෙටි පනිවිඩයකින් මෙසේ කියැවිණ: "***සීමිත අවස්ථාවක්, ප්‍රථම ඉල්ලුම්කරුවන්ට පමණයි, කොළඹ ලොජ් එකක සිටි විචිනියාවට නොමිලයේ ගොස් ආපසු පැමිණීමට ආරක්ෂ අමාත්‍යංශයෙන් විමසන්න. විස්තර සඳහා XXXXXX අංකයට ගෝඨාට කතා කරන්න.***"

ඒ සමගම පැමිණි දෙවැනි එස්එම්එස් කෙටි පනිවිඩයෙන් කියැවුනේ මෙසේ ය: "***යළි නොලැබෙන අවස්ථාවක් -කලින් ලද පණිවිඩය 10 දෙනෙකුට යවන අය සුදු වෑන් රථයකින් කොටුව දුම්රිය පොලේ සිට යලි නොපැමිනිම පිනිස කිරිඇල්ලට හෝ වෙන්නප්පුවට යවනු ලැබේ. ගොඨාට කතා කිරීම අවශ්‍ය නැත. දැනටමත් ඔවුන් ඔබ සොයා එනවා ඇත.***"

සත්‍යය ප්‍රබන්ධයට වඩා විශ්මය ජනක යැයි කියනු ලැබේ. රාජපක්ෂ ආණ්ඩුව සම්බන්ධයෙන් නම් එය හරියටම හරි ය.

කොළඹ ලොජ්හි නවාතැන් ගෙන සිටි දෙමළ ජනයා බුරුතු පිටින් බස් රථවල පටවා පිටුවාහල් කෙරුනේ පසුගිය 07 බ්‍රහස්පතින්දා ය. එම අමනොඥ සහ මානව විරෝධී ක්‍රියාව වසා ගැනීමට ආණ්ඩුවේ පුවත් දගකවන්නෝ දන්නා සියලුම ගැට ගැසූහ.

ඒ අය ගියේ ස්වේච්ඡාවෙන් යැයි කෙහෙළිය රඹුක්වැල්ල ඇමැති කීය. නමුත් ස්වෙච්ඡාවෙන් ගියේ නම් අලුයම 3.45ට පොලීසිය ඔවුන් සොයා ලොජ් වලට ගියේ ඇයිදැයි හොර රහසේම පිට කලේ මන්දැයි කෙහෙළිය කීවේ නැත.

පොලිස්පති වික්ටර් පෙරේරා කටකාරයෙකි. ඔහු කීයේ නොමිලයේ ගමන් පහසුව සලසන්නේ නම් ආපසු යෑමට එම ජනයා කැමැත්ත ප්‍රකාශ කළ බව යි. කණගාටුවකට මෙන් රාජිත සේනාරත්න ඇමැතිවරයා ද එසේ දෙමළ ජනයා පිටමං කිරීම සාධාරණ කරමින් කාගේ හෝ පිට කැසුවේ ය.

## බය නැති ජනමාධ්‍ය

නමුත් පිට කොන්දක් තිබූ ජනමාධ්‍ය සහ සිවිල් සමාජය විසින් මේ පචෝරිස්ලා දඩු කදේ ගැසුනි. පිටුවාහල් කිරිම පිණිස ගෙන යමින් සිටි පිට කොන්දක් තිබූ දෙමලුන් සිරස ( එම්ටීවී

එම්බීසී) සහ හිරු ( ඒබීසී) යන ජනමාධ්‍යයන්ට සජීවී ව සම්බන්ද වෙමින් තමන් ගෙන යන්නේ බලහත්කාරයෙන් බවත් ගෙන යන තැනක් නොදන්නා බවත් ලොවට ම කියා සිටියා ය.

විදේශීය පුවත් ආයතන මේ බලහත්කාර පිටුවාහල් කිරීම සැනෙන් ලොව පුරා සන්නිවේදනය කළා ය. මෙම ජනයා ගෙන යමින් තිබූ කොළඹ දඹුලු පාර දිගටම සිය කැමරාකරුවන් රුඳවූ සිරස වීඩියෝ මාධ්‍යයෙන් ම ඇත්ත ඇති ලෙස දැක්වීමට සමත් වූවා ය.

පසු දින වීරයාගේ භූමිකාව යුතු ලෙසම ජනාධිපතිට හිමිවිය. වහාම පරීක්ෂනයක් පවත්වන ලෙස ඔහු තදින් නියෝග කලේය. වහාම පොලිස්පතිගෙන් වාර්තාවක් ඉල්ලා සිටියේ ය.(ඒ වාර්තාව කවදාවත් නොලැබෙන එකක් වන බවට මෙන්න කැට)

එම ඉල්ලීමට දෙදිනකට පසු ජනමාධ්‍යයෙන්ම උත්තර බැදුනි. 10වන සඳුදා සන්ඩේ ලීඩර් පුවත්පත පොලිස් ලේඛන උපුටා දක්වමින් කියා සිටියේ මෙම නියෝගය ජනාධිපති සහෝදර ආරක්ෂ ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් දෙන ලද්දක් බව යි. ආණ්ඩුව කට හෙල්ලුවේ නැත. එම නියෝගය පැහැදිලි නිසා ය. එය මුසාවක් යැයි මුසාවක් කීවේ ද නැත.

අමෙරිකාව. ඉන්දියාව, යුරෝපීය සංගමය, නොර්වේ, එක්සත් ජාතීන්ගේ සංගමයේ ආයතන, මෙන්ම ජාත්‍යන්තර මානවහිමිකම් සංවිධාන මෙම පිටමං කිරීම එකපැහැර හෙළා දුටුවෝ ය. අන්තිම ඇණය වැදුනේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පෙත්සම මත පිටමං කිරීම ව්‍යවස්ථා විරෝධි යැයි ශ්‍රෙෂ්ඨාධිකරණය දුන්  නඩු තීන්දුවෙනි.

## රත්නසිරි ගේ සමාව

ඊලඟ ජවනිකාව සදුදා රඟ දැක්වුනි. ඒ අගමැති රත්නසිරි මගිනි.  එලෙස දෙමළ ජනයා බලහත්කාරයෙන් පිටමං කිරීම ගැන ඔහු ආණ්ඩුව වෙනුවෙන් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලුවේ ය. වරදෙහි වගකීම අප ගන්නවා, යැයි ඔහු කීය. අහෝ, කෙහෙලිය සහ පොලිස්පති!

දැන් නාටකය අවසන් යැයි පෙනෙන්ට තිබුණ ද ඇන්ඩි කොම්පැනි කොමඩිය අවසන්ව තිබුනේ නැත. ඊළඟට ආවේ රාජපක්ෂ ගෝඨාභය යි. ඔහු රොයිටර් සහ බීබීසී යට කීවේ එලෙස ලොජ්හි සිටි ජනයා පිට මං කිරීම වඩා හොද තෝරා ගැනීම බවයි: "***නැත්නම් අපට ඒ සියලු දෙනා අත් අඩංගුවට ගන්න තිබුනා. අප ඔවුන්ට කියන්නේ කොළඹ කරන්න දෙයක් නැත්නම් ආපහු ගෙදර යන්න, අත්අඩංගුවට ගන්න කලින්. මෙහෙයුම හොදම දෙයක්. නැත්නම් ඔවුන් අත් අඩංගුවේ."***

එස්එම්එස් කරුවන් හරි ය. නොමිලයේ වව්නියා ගමන ගොඩාගේ මෙහෙයුමකි. දැන් අගමැති රත්නසිරි යළි සමාව ඉල්ලා සිටිය  යුතු ය. සමාව ඉල්ලුවාට ය. නැතහොත් ඔහු ද්‍රෝහියකු වීමට ඉඩ තිබේ. රාජපක්ෂ මහින්ද පොලිස් පරීක්ෂනය නතර කළ යුතු ය. නැතහොත්  ඔහු ද ද්‍රෝහියකු විය හැකි ය.

## අයියා ද මල්ලීද?

සුදු වෑන් කෙටි පනිවිඩයත් හරි ය.

පැහැර ගැනීම් පිලි ගනිමින් ගෝඨා මෙසේ කීවේ ය:  "***අමෙරිකාවේ දී කරහම රහස් මෙහෙයුම් කියනවා. අප මෙහේ කරාම පැහැර ගැනීම් යැයි කියනවා"*** මේ අතර වාරයේ ජනාධිපතිවරයා අතුරුදහන්වීම් සෙවීමට විසිහතර පැයේ කම්ටුවක් පත් කරමින් සිටියේ ය. නාඩගම කාගේ එකද?

ඉහත කී සිය සම්මුඛ සාකච්ජාවන්හි දී රාජපක්ෂ ගෝඨාභය ඇමෙරිකාවට සහ යුරෝපීය රටවලට දෙහි කැපුවේ ය. අපට තමුසෙලා ඕනෑ නෑ, සාර්ක් රටවල් ඉන්නවා යැයි කී ය.

අයියා ඡන්දය දිනන තුරු  ඔහු පදිංචි වී සිටියේ ඇමෙරිකාවේ ය. තවමත් ඔහු ඇමෙරිකානු පුරවැසියෙකි !

රාජපක්ෂ ඇන්ඩ් කොම්පැනි කොමඩිය ඉවර නැත. කණගාටුවට කරුන මෙම කොමඩිය රඟ දැක්වෙන්නේ රූපවාහිනී පෙට්ටිය ඇතුලේ නොව අපේ ජීවිත සමඟ වීම ය.

ප.ලි.
(*ජනමාධ්‍යවේදය හෘදය සාක්ෂියේ භාවිතයක් විය යුත්තේ මෙවැනි මානව ඛේදවාචකයන් මුණ ගැසෙන මොහොතේ දීය. හඬක් නැතිව ගිය එවැනි ජන පිරිසකට මුල් පිට මුල් පුවතේ ඉඩ නැතිව ගිය විට, කතුවැකියේ බරසාර සභාය නැතිව ගිය විට ඔවුන්ට කවර පිහිටක් ද?)*